# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.06 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1999/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2025.11.05 වන දින අළුයම් කාලයේ බගවන්තලාව පොලිස් වසමේ තෙරේසියාවත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවෙකු ගැරීම් උපකරණද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 42 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බගවන්තලාව පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව පුරා වස්තු කැණීම් සිදු කරමින් සිටි සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට - රිදීමාලියද්ද පොලිස් ස්ථානය.**

2025.11.05 වන දින අළුයම් කාලයේ රිදීමාලියද්ද පොලිස් වසමේ ඌරාකොටුව ප්‍රදේශයේදී රිදීමාලියද්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව පුරා වස්තු කැණීම් සිදු කරමින් සිටි සැකකරුවන් 08 දෙනෙකු කැණීම් උපකරණද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 27 ත් 67 ත් අතර වයස්වල පසුවන රිදීමාලියද්ද, මහියංගණය, අරාවත්ත, රිටිගහ හා දෙහිඅත්තකන්ඩිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

රිදීමාලියද්ද පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. දිය අනතුරකින් විදෙස් ජාතිකයෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය කළුතර උතුර.**

2025.11.05 වන දින සවස් කාලයේදී කළුතර උතුර පොලිස් වසමේ වාඩියමංකඩ ප්‍රදේශයේ වෙරළ තීරයේදී දිය නෑමට ගිය විදෙස් ජාතිකයෙකු දිය වැලකට හසුව මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් කොස්තාපල් 84540 මදුසංක, පොලිස් කොස්තාපල් 34970 ලක්මාල්, පොලිස් කොස්තාපල් 94884 චතුරංග හා පොලිස්

කොස්තාපල් 103619 කුමාරසිංහ යන නිලධාරීන් විසින් එම පුද්ගලයා බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 43 ක් වන රුසියානු ජාතිකයෙකි.**

**04.** **මුහුදේ දිය නෑමට ගිය පුද්ගලයෙකු අතුරුදන් වීම - ගන්දර පොලිස් වසම.**

2025.11.05 වන දින දහවල් කාලයේ ගන්දර පොලිස් වසමේ තලල්ල මුහුදු වෙරළේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියඹට ගසාගෙන ගොස් අතුරුදන් වී ඇති බවට ගන්දර පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදන් වූ පුද්ගලයා වයස අවුරුදු 19 ක් වූ රංසෑගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදන් වූ පුද්ගලයා තවත් පුද්ගලයින් 05 දෙනෙකු සමඟ වෙරළ තීරයේ දිය නාමින් සිටියදී මෙලෙස දියඹට ගසාගෙන ගොස් අතුරුදන් වී ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අතුරුදන් වූ පුද්ගලයා සොයා හිරිකැටිය පොලිස් ස්ථානයට අනුයුක්ත ජීවිතාරක්ෂක නිලධාරීන් සහ නාවික හමුදාව එක්ව මෙහෙයුම් දියත් කර ඇත. ගන්දර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **හදිසි ගින්නක් - පල්ලේකැලේ පොලිස් වසම.**

2025.11.05 වන දින රාත්‍රී කාලයේ පල්ලේකැලේ පොලිස් වසමේ කාර්මික ජනපදය තුල පිහිටි ගිනි පෙට්ටි කාර්මාන්ත ශාලාවේ හදිසි ගින්නක් හටගෙන ඇති බවට පල්ලේකැලේ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

පල්ලේකැලේ පොලිසිය, මහනුවර ගිනි නිවන ඒකකයේ නිලධාරීන් හා යුධ හමුදා නිලධාරීන් සහය ඇතිව ගින්න මැඩපවත්වා ඇත. මෙම ගින්නේ දේපල හානි පමණක් සිදු වී ඇති අතර තුවාල හෝ ජීවිත හානි කිසිවක් වාර්තා නොමැත. ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර පල්ලේකැලේ පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

**06.** **දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - පෑලියගොඩ පොලිස් වසම.**

2025.11.05 වන දින රාත්‍රී කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ තොරණ හන්දිය තෙලඟපාත දුම්රිය හරස් මාර්ගයේදී කොළඹ සිට පොල්ගහවෙල දක්වා ධාවනය වූ දුම්රියක වත්තල සිට තොරණ හන්දිය දෙසට ධාවනය වූ ජීප් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ජීප් රථයේ රියදුරු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - හිඟුරක්ගොඩ පොලිස් වසම.

2025.11.05 වන දින අළුයම් කාලයේ හිඟුරක්ගොඩ පොලිස් වසමේ පන්සල්ගොඩැල්ල තල්පොත මාර්ගයේ 07 කණුව ප්‍රදේශයේදී පන්සල්ගොඩැල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරළී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු ගල්අමුණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ හිඟුරක්දමන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හිඟුරක්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2025.11.05 වන දින උදෑසන කාලයේ වාරියපොල පොලිස් වසමේ අනුරාධපුර පාදෙණිය මාර්ගයේ කුඹුක්ගහමුල හන්දිය ආසන්නයේදී අනුරාධපුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ දකුණු පසට හැරවීමට යාමේදී පසුපසින් පැමිණි බස් රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු වාරියපොල රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇති අතර පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ මිනුවන්ගැටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - බියගම පොලිස් වසම.

2025.11.05 වන දින උදෑසන කාලයේ බියගම පොලිස් වසමේ කැලණිය බියගම මාර්ගයේ රග්ගහවත්ත ප්‍රදේශයේදී බියගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකිව අසල සංඥා කණුව ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු බියගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ මල්වාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇති අතර බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - මැදවච්චිය පොලිස් වසම.

2025.11.05 වන දින රාත්‍රී කාලයේ මැදවච්චිය පොලිස් වසමේ මැදවච්චිය හොරව්පතාන මාර්ගයේ මැදවච්චිය ප්‍රදේශයේදී මැදවච්චිය දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගය අයිනේ සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා මැදවච්චිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ උල්පත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මැදවච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - හෝමාගම පොලිස් වසම.

2025.11.05 වන දින රාත්‍රී කාලයේ හෝමාගම පොලිස් වසමේ වලච්චි හන්දිය උණපදුර හන්දිය අතුරු මාර්ගයේ නගරසීමා මාවත අසලදී උණපදුර හන්දිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු හා පසුපැදිකරු හෝමාගම රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ හංවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**